State Ministry of Education Reforms, Promotion of Open Universities and Distance Learning

අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, විවෘත විශ්වවිද්‍යාල හා දුරස්ථ අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යාංශය

G.C.E. ORDINARY LEVEL - Rehearsal Question Paper

අ.පො.ස. සා/පෙළ - පෙරහුරු ප්‍රශ්න පත්‍රය

Science

විද්‍යාව

(QUESTION PAPER) - II

ප්‍රශ්න පත්‍රය - II

අනුග්‍රහය :

NenasaTV

අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, විවෘත විශ්වවිද්‍යාල හා දුරස්ථ අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යාංශය

විවෘත විශ්වවිද්‍යාල හා දුරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන ශාඛාව

අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය – 2020

ආදර්ශ ප්‍රශ්න පත්‍රය

විද්‍යාව - II	34 S II	කාලය පැය 02 යි

A කොටස - ව්‍යුහගත රචනා

1. (A) පරිසර පද්ධතියකට අදාලව පෝෂීය මට්ටම් තුනකින් යුත් යටිකුරු සංඛ්‍යා පිරමිඩයක් පහත දක්වා ඇත. නිශ්පාදකයාට වඩා 500% ක වැඩිවීමක් ප්‍රාථමික යැපෙන්නන් සිටින අතර තුන්වන පෝෂීය මට්ටම දෙවන පෝෂීය මට්ටමට වඩා 300% කින් වැඩිය.



I. දී ඇති තොරතුරු අනුව X හි අගය කොපමණ ද? ....

II. දී ඇති මට්ටම් තුනට අදාල ව සංඛ්‍යා නිරූපනය කිරීමට පහත අක්ෂ මත තීර ප්‍රස්තාරයක් ගොඩනගන්න.



III. ඉහත ආකාරයේ යටිකුරු සංඛ්‍යා පිරමිඩයක් පැවැතිය හැකි අවස්ථාවක් සඳහා අදාල පෝෂීය මට්ටම්වලට සුදුසු ජීවීන් සඳහා උදාහරණයක් දෙන්න. (එක් එක් පෝෂීය මට්ටමට වෙන වෙන ම සුදුසු ජීවීන් නම් කරන්න)

නිෂ්පාදකයා: ....

ප්‍රාථමික යැපෙන්නා : ....

ද්විතියික යැපෙන්නා : ....

IV. ජෛව පළිබෝධ පාලනය යනු කුමක්ද?

....

....

(B) ප්‍රභා රසායන ධූමිකාව මෙන්ම ඇතැම් රූපලාවන්‍ය ද්‍රව්‍ය මගින් ද විවිධ පාරිසරික ගැටලු ඇතිවේ. එසේ ම තිරසර සංවර්ධනයේ දී පුනර්ජනනීය ශක්ති සම්පත් ද වැදගත් වේ.

I. ප්‍රභා රසායන ධූමිකාව යනුවෙන් අදහස් වන්නේ කුමක් ද?

....

....

II. ප්‍රභා රසායන ධූමිකාව මගින් ඇතිවන අහිතකර බලපෑමක් සඳහන් කරන්න.

....

....

III. ඇතැම් රූපලාවන්‍ය ද්‍රව්‍ය නිසා ඇතිවී ඇති අහිතකර බලපෑමක් සඳහන් කරන්න.

....

....

IV. පුනර්ජනනීය ශක්ති සඳහා උදාහරණ දෙකක් ලියන්න.

....

....

V. බලශක්ති අර්බුදයට එක් හේතුවක් සඳහන් කරන්න.

....

....

2. (A) අප ගන්නා ආහාර කාබෝහයිඩ්රේට් , ප්‍රෝටීන්, ලිපිඩ වශයෙන් ප්‍රධානව වර්ග කෙරේ.

I. පහත දැක්වෙන කාබෝහයිඩ්‍රේට නම් කරන්න.

a. ග්ලූකෝස් ....

b. සුක්‍රෝස් ....

c. සෙලියුලෝස් ....

II. පහත දැක්වෙන්නේ පිෂ්ඨය හඳුනා ගැනීමේ පරීක්ෂණ පියවර වේ. එය සම්පූර්ණ කරන්න.

a. පිෂ්ඨ ද්‍රාවණයට එක් කරන ප්‍රතිකාරකය ....

b. නිරීක්ෂණය ....

III. ආහාර වශයෙන් ප්‍රෝටීන මගින් සිරුරට ලැබෙන ප්‍රධාන මෙහෙය ලියා දක්වන්න.

....

IV. ලිපිඩ ආහාර හඳුනාගැනීමට විද්‍යාගාරයේ දී යොදාගනු ලබන ප්‍රතිකාරකය නම් කරන්න.

....

(B) ජීවයේ මූලික තැනුම් ඒකකය සෛලය වේ.

I. ශාක සෛලය සත්ත්ව සෛලයකින් වෙනස්වන ආකාර කිහිපයකි.

a. සත්ත්ව සෛලයේ සෛල ආවරණය වශයෙන් පිහිටි කොටස නම් කරන්න.

....

b. ඔබ ඉහත නම් කළ ආවරණය සෑදී ඇති ද්‍රව්‍යය හඳුන්වන්න

....

II. සෛල තුළ ඇති ක්ෂුද්‍ර ඉන්ද්‍රියිකා කිහිපයක් මෙසේ නම් කළ හැක. මයිටොකොන්ඩ්‍රියම, ගොල්ගි සංකීර්ණය, රයිබොසෝම, අන්ත: ප්ලාස්මීය ජාලිකා, රික්තක, න්‍යෂ්ටිය.

පහත දැක්වෙන පැහැදිලි කිරීමට අනුව වෙන් කර ලියන්න.

a. පටල නොදරන ඉන්ද්‍රියකාව නම් කරන්න. ....

b. ලිපිඩ හා ස්ටොරොයිඩ නිපදවීම ....

c. ස්වායු ස්වසනය සිදු කිරීම. ....

d. ප්‍රවේණික ද්‍රව්‍යය ගබඩා වී ඇති කොටස. ....

III. වෛරස ඉතා සියුම් ක්ෂුද්‍ර කොටස් වේ. අපහසුවෙන් වුවද ඉලෙක්ට්‍රෝන අන්වීක්ෂයකින් නැරඹිය හැකි වේ.

a. වෛරස සෑදී ඇති න්‍යෂ්ටික අම්ල දෙක නම් කරන්න

1).. 2)..

b. වෛරස ක්‍රියාත්මක වන ස්ථානය නම් කරන්න.

....

c. වෛරසයක් ජීවියෙකු සේ හැසිරෙන අවස්ථා නම් කරන්න.

....

3. (A) රසායනික ප්‍රතික්‍රියාවකින් විද්‍යුත් ධාරාවක් නිපදවා ගත හැක. එවැනි කෝෂයක රූපය පහත දැක්වේ.



I. (a) Y ලෙස දැක්වෙන සුදුසුම උපකරණය නම් කරන්න.

....

(b) විද්‍යාගාරයේ දී යොදා ගනු ලබන X ද්‍රාවණය නම් කරන්න.

....

II. (a) X ද්‍රාවණයේ පවතින අයන වෙන් කර ලියා දක්වන්න.

....

(b) කෝෂය ක්‍රියාත්මකව පවතින විට Zn හා Cu අග්‍ර මත දක්නට ලැබෙන නිරීක්ෂණ මොනවා ද?

....

III. a) ඉහත විද්‍යුත් කෝෂයේ Zn ලෝහය මත ඇතිවන අර්ධ අයනික ප්‍රතික්‍රියා සමීකරණය ලියා දක්වන්න.

....

(b) Cu අග්‍රය මත ඇතිවන අර්ධ අයනික ප්‍රතික්‍රියාව සමීකරණයකින් ලියා දක්වන්න.

....

IV. කෝෂයේ ඔක්සිකරණය සහ ඔක්සිහරණය සිදුවන අග්‍ර පිළිවෙලින් නම් කරන්න.

....

(B) ප්‍රතික්‍රියාවක සීඝ්‍රතාව පරීක්ෂා කිරීමට මෙන්ම ඒ සඳහා බලපාන සාධක කවරක්ද යන්න සොයා බැලීමට සිදුකල පරීක්ෂණයක තොරතුරු පහත දැක්වේ.

ඇටවුම	Mgලෝහයේ ස්වභාවය	තනුක HCl අම්ලය	උෂ්ණත්වය
A	කුඩු 5g	1 mol dm^{-3}	30 °C
B	කැබලි 5g	2 mol dm^{-3}	30 °C
C	කුඩු 5g	2 mol dm^{-3}	30 °C
D	කුඩු 5g	2 mol dm^{-3}	60 °C

I. ඉහත දත්ත උපයෝගී කරගනිමින් වගුවේ දැක්වෙන කොටස සම්පූර්ණ කරන්න

	ඇටවුම් යුගලය	ප්‍රතික්‍රියා සීඝ්‍රතාව කෙරෙහි බලපාන සාධක
(a)	A හා C	....
(b)	B හා C	....
(c)	C හා D	....

II. ඇටවුමේ සිදුවන රසායනික ප්‍රතික්‍රියාව තුලිත සමීකරණයකින් ලියන්න.

....

III. එම ප්‍රතික්‍රියාව කුමන වර්ගයේ ප්‍රතික්‍රියාවක් ද?

....

IV. වායුමය ඵල ප්‍රමාණය ග්‍රෑම්වලින් ප්‍රකාශ කරන්න.

....

4. (A) ද්‍රවයක් තුළ වස්තුවක් ගිල්වන විට දෘශ්‍ය බර වෙනස් වේ. (ජලයේ ඝනත්වය $1kgm^{-3}$ කි.)



I. (a) රූපයේ දැක්වෙන වස්තුව ජලයේ ගිල්වන විට එහි දෘශ්‍ය බර කොපමණ ද?

....

(b) ජලය මගින් වස්තුව මතට ඇතිකල බලය කොපමණද?

....

II. X වස්තුවේ ඝනත්වය සෙවීම සඳහා ප්‍රකාශනයක් ලියන්න.

....

III. X වස්තුවේ ඝනත්වය ගණනය කරන්න

....

(B) අමතර බලය නොසලකා හරින ලද 500g බර ට්‍රොලියක චලිතය සඳහා තොරතුරු පහත වගුවේ දැක්වේ.

කාලය(s)	0	2	4	6	8	10	12	14
යොදන බලය(N)	0	1	2	3	4	6	6	6
ඝර්ෂණ බලය(N)	0	1	2	3	2	2	2	2

I. ට්‍රොලිය මත යෙදෙන සීමාකාරී ඝර්ෂණය කොපමණ ද?

....

II. චලනය සිදුවනවිට ට්‍රොලියේ ඝර්ෂණය ඇති කරවන ස්ථාන දෙකක් නම් කරන්න.

01..

02..

III. ට්‍රොලියේ චලිතයට බලපාන බලය කොපමණ ද?

....

IV. ට්‍රොලියේ චලනය ආරම්භ වූයේ කීවෙනි තත්පරයේ දී ද?

....

V. ට්‍රොලියේ ත්වරණය කොපමණ දැයි ගණනය කරන්න.

....

(C) රූපයේ දැක්වෙන පරිපථ සටහන උපයෝගී කරගනිමින් පහත කොටසට පිළිතුරු සපයන්න.



I. V_1 හි පාඨාංකය 2V නම් R_1 හි අගය ඕම් කොපමණ ද?

....

II. V_2 හි පාඨාංකය කොපමණ ද?

....

III. R_2 හි ප්‍රතිරෝධ අගය කොපමණ ද?

....

IV. R_1 ප්‍රතිරෝධ අගය දැක්වෙන වර්ණ කේත දක්වන්න.

....

B කොටස

5. (A) මිනිසාගේ ශ්වසනය සංකීර්ණ ක්‍රියාවලියක් වන අතර ඒ සඳහා සැකසුන පද්ධතිය ශ්වසන පද්ධතිය වේ. එහි ආරක්ෂාව සඳහා මුඛ ආවරණ පැලදීම අද වනවිට සිදුවේ.



i) a, b, හා c කොටස් නම් කරන්න.

ii) මහා ප්‍රාචීරය මගින් ඉටු කරන කෘත්‍යය කුමක්ද?

iii) b කොටසේ දුර්වල වීමෙන් ඇතිවිය හැකි අහිතකර තත්ත්වය කුමක් ද?

iv) වායු හුවමාරුව කාර්යක්ෂමව සිදුවීමට b හි දැකිය හැකි අනුවර්තන දෙකක් ලියා දක්වන්න.

v) නාස් කුහරයේ අපර කොටසින් ඉටු කරන වැදගත් ක්‍රියාවක් නම් කරන්න.

vi) මුඛ ආවරණ පැළඳීම මගින් ඉටුවන මෙහෙය කුමක් ද?

(B) මිනිසාගේ අන්තරාසර්ග පද්ධතියට අයත් ග්‍රන්ථි කිහිපයකි.(පිටියුටරීන්, තයිරොයිඩය, අධිවෘක්ක ග්‍රන්ථි, ඩිම්බ කෝෂ, වෘෂණ කෝෂ)

i) (a) කැල්සිටොනික් හෝමෝනය ස්‍රාවය කරන ග්‍රන්ථිය නම් කරන්න.

(b) පිටියුටරිය මගින් ශ්‍රාවය කරන හෝමෝනය නම් කරන්න.

(c) ඇඩ්‍රිනලීන් හෝමෝනය නිසා සිරුරේ සිදුවන වෙනස්වීමක් සඳහන් කරන්න

ii) (a) රුධිරයේ ග්ලූකෝස් මට්ටම අඩුවන විට ක්‍රියාත්මක වන හෝමෝනය නම් කරන්න.

(b) ඊස්ට්‍රජන් හෝමොනයේ බලපෑමක් සඳහන් කරන්න

(c) පුරුෂ ද්විතීයික ලිංගික ලක්ෂණ කෙරෙහි බලපාන හෝමෝනය කුමක් ද?

(C) පොදු ගති ලක්ෂණවලට අනුව ජීවීන් කාණ්ඩවලට බෙදා දැක්වීම වර්ගීකරණය ලෙස හැඳින්වේ.

i) ජීවීන් වර්ගීකරණය මූලික ආකාර දෙක ලියා දක්වන්න.

ii) ප්‍රතිජීවකවලට සංවේදී නොවන ජීවී ඛාණ්ඩය අයත් අධිරාජධානිය නම් කරන්න.

iii) දිලීර විශේෂ අයත් රාජධානිය කුමක් ද?

iv) පෘෂ්ඨවංශීන් ව්‍යුහමය ලක්ෂණ පදනම් කර ඛාණ්ඩ කෙරේ.

මඩුවා , සලමන්දරා, කිඹුලා, පැස්බරා අයත් ඛාණ්ඩ වෙන්කර ලියා දක්වන්න.

6. (A) ප්‍රාමාණික ද්‍රාවණ පිළියෙල කිරීම විද්‍යාගාර කටයුතු සඳහා යොදා ගනී.

i) (a) විද්‍යාගාරයේ දී නිශ්චිත සාන්ද්‍රණය සහිත ද්‍රාවණ පිළියෙල කිරීමට යොදා ගන්නා උපකරණ හතරක් නම් කරන්න

(b) කැල්සියම් හයිඩ්‍රොක්සයිඩ් හි සූත්‍රය $Ca(OH)_2$ නම් එහි මවුලික ස්කන්ධනය කොපමණ ද?(Ca=40 , O=16 H=1)

(c) $Ca(OH)_2$ ග්‍රෑම් 148 ක අඩංගු $Ca(OH)_2$ මවුල ප්‍රමාණය ගණනය කරන්න

ii) (a) $Ca(OH)_2$ මවුලයක අඩංගු අණු සංඛ්‍යාව කොපමණ ද?

(b) එම අණුවේ ඇති පරමාණු සංඛ්‍යාව කීයද?

(c) ද්‍රාවණයක මවුල සංඛ්‍යාව දැක්වීමට ප්‍රකාශණයක් ලියන්න.

(B) x, y, z ද්‍රාව්‍ය වන අතර E, F, G ද්‍රාවක වේ. තොරතුරු වගුවේ දැක්වේ.

ද්‍රාව්‍යය	ද්‍රාවකයේ ගුණ	ද්‍රාවකය	ද්‍රාවකයේ ගුණ
x	අයනික සංයෝගයක්	E	ධ්‍රැවීයතාවය වැඩි ද්‍රාවකයකි.
y	ධ්‍රැවීය සහසංයුජ සංයෝගයක්	F	ධ්‍රැවීයතාවය අඩු ද්‍රාවකයකි.
z	නිර්ධ්‍රැවීය සහසංයුජ සංයෝගයක්	G	නිර්ධ්‍රැවීය ද්‍රාවකයකි.

i) E, F, G සමාන පරිමා සැලකූවිට x ද්‍රාව්‍ය වැඩිම ස්කන්ධයක් දියවනුයේ කුමන ද්‍රාවකයේ ද?

ii) E, F හා G සමාන පරිමා තුළ z ද්‍රාව්‍යය පිළිවෙලින් a , b c යන ස්කන්ධ දිය විය. a , b , c ස්කන්ධ ආරෝහණ පිළිවෙලින් දක්වන්න.

iii) හොඳින් විද්‍යුතය සන්නයනය කරන ද්‍රාවණයක් පිළියෙල කරගැනීමට වඩාත්ම උචිත ද්‍රාවකය හා ද්‍රාව්‍යය තොරතුරු අනුව නම් කරන්න.

iv) E, F, G ද්‍රාවක අතුරින් වඩාත්ම වාෂ්පශීලී වේයැයි සිතිය හැකි ද්‍රාවකය කුමක් ද?

(C) රූපයේ දැක්වෙන්නේ මූල ද්‍රව්‍යය විද්‍යුත් වශයෙන් ආකර්ෂණය වූ ආකාරයයි.





i) (a) A කොටසට අයත් මූල ද්‍රව්‍යය දෙකෙහි පරමාණුක ක්‍රමාංකය ලියා දක්වන්න

(b) එම මූල ද්‍රව්‍යය දෙක නම් කරන්න

(c) A හි දැක්වෙන සංයෝගය හා බන්ධන වර්ගය නම් කරන්න

ii) (a) B කොටසින් දැක්වෙන සංයෝගය නම් කරන්න

(b) B හි දැක්වෙන බන්ධන වර්ගය ලියා දක්වන්න

7. (A) වායුවක් මගින් පීඩනයක් ඇතිවන බව නිරීක්ෂණයට යොදාගත් ක්‍රියාකාරකම පහත දැක්වේ.





බැලූන සවි කිරීමට පෙර

i) a රූපයේ පවතින ජලකඳේ දෙපස උසින් සමාන වීමට හේතුව කුමක්ද?

ii) b රූපයේ x හා y ලක්ෂවලදී පීඩනය ගැන කුමක් කිව හැකිද?

iii) h උස 3cm , ජලයේ ඝනත්වය $1kgm^{-1-}$, $g=10ms^{-2-}$ නම් h ජල කඳ මගින් ඇතිවන පීඩනය ගණනය කරන්න

iv) ජලය වෙනුවට රසදිය ද්‍රවයක් ලෙස භාවිත කලේනම් h උස ගැන කුමක් කිව හැකිද?

(B) 240 V ගෘහ විදුලිය යොදා ගනිමින් තාපන දඟරයක් මගින් ජලය රත් කිරීමට යොදාගන්නා අවස්ථාවක් රූපයේ දැක්වේ.

i) තාපන දඟරය සෑදීමට යොදාගන්නා ලෝහය නම් කරන්න

ii) තාපන දඟරය ක්‍රියාත්මක වීමෙන් මැටි භාජනයේ පිටතද උණුසුම්විය. තාපය ගමන් කළ ආකාරය ගැලීම් සටහනකින් පෙන්වන්න.

iii) දඟරයේ ක්ෂමතාව 1000W නම් විනාඩි 5 ක කාලයක් තුලදී

a) දඟරයෙන් ඉවත් වූ තාප ශක්තිය කොපමණ ද?

b) දඟරය තුළින් ගලායන ධාරාව කොපමණ ද?

c) වැය වූ විද්‍යුත් ශක්ති ඒකක ප්‍රමාණය කොපමණ ද?

(C) අවතල දර්පණ භාවිත කොට තාත්වික මෙන්ම අතාත්වික ප්‍රතිබිම්බ ලබා ගත හැක.

i) තාත්වික සහ අතාත්වික ප්‍රතිබිම්බ ඇතිවන අවස්ථා වෙන් වශයෙන් ලියා දක්වන්න.

ii) දෙන ලද අවතල දර්පණයේ දළ නාභීය දුර සොයා ගැනීමට ක්‍රමයක් යෝජනා කරන්න.

iii) උත්තල දර්පණයක් ඉදිරියේ ඇති වස්තුවේ පිහිටීම කිරණ සටහනකින් දක්වන්න.



8. (A) ප්‍රභාසංස්ලේශනය සඳහා යම් සාධකයක බලපෑම පරීක්ෂා කිරීමට යොදාගත් ඇටවුමක් ආලෝකය ලැබෙන පරිදි තබා ඇත.



i) (a) ප්‍රභාසංස්ලේෂණය සඳහා කුමන සාධකය පරීක්ෂා කිරීමට ඇටවුම සුදුසු වේදැයි ලියන්න.

(b) ඉහත පරීක්ෂාව සඳහා ශාකය සුදානම් කරගත යුතු ආකාරය දක්වන්න

ii) (a) C ඇටවුම මගින් කුමන කරුණක් පරීක්ෂා කරයිද?

(b) ප්‍රභාසංස්ලේශනයට අවශ්‍ය කුමන සාධකය පංතිකාමරයක පරීක්ෂා කළ නොහැකිද?

iii) (a) ශාකපත්‍ර කහ පැහැ ගැන්වීම පෝෂක ඌණ වීමෙන් සිදුවේ. පෝෂකය නම් කරන්න.

(b) කැල්සියම් ඌණ වීමෙන් ශාකයේ කුමන වෙනසක් ඇතිවේද?

(C) විද්‍යුත් ශක්තිය විවිධ ප්‍රභව මගින් උත්පාදනය වේ.

i) (a) සුළං විදුලි බලාගාර, තාප විදුලිබලාගාර ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වේ. එම අවස්ථාවල විදුලිය ජනනය වන උපක්‍රම ලියන්න

(b) ශ්‍රී ලංකාවේ නිවසකට ලැබෙන විදුලියේ ස්වභාවය හඳුන්වන්න

ii) චුම්භක ධ්‍රැව අතර කම්බි දඟරය භ්‍රමණය වීමෙන් විදුලිය නිපද වේ.



(a) නිපදවන විදුලි ධාරාවේ ප්‍රභලතාව කෙරෙහි බලපාන සාධක දෙකක් ලියන්න

(b) කම්බි දඟරය භ්‍රමණය වනවිට විදුලි පහන් දැල්වීම නිරීක්ෂණය වනුයේ කුමන ආකාරයකින් ද?

(c) උපරිම වෝල්ටීයතාවයක් ඇතිවන අවස්ථාවේ කම්බි දඟරයේ x y පිහිටීම හා චුම්භක ධ්‍රැව අතර සම්බන්ධය කුමක් ද?

(d) සරල මෝටරයක කොටස් පහත දැක්වේ.



i) A, B, C කොටස් නම් කරන්න

ii) A කොටසේ ක්‍රියාව මෝටරයේ භ්‍රමණයට බලපාන අන්දම ලියන්න.

9. (A) ලුණු නිශ්පාදන ක්‍රියාවලිය පහත දැක්වෙන ආකාරයේ පියවර අනුගමනය කොරේ.

මුහුදු ජලය → නොගැඹුරු විශාල තටාකය → මධ්‍යස්ත තටාකය → කුඩා විශාල තටාකය → මව් ද්‍රාවණය

i) (a) ශ්‍රී ලංකාවේ ලුණු නිශ්පාදන ක්‍රියාවලිය හඳුන්වන්නේ කෙසේ ද?

(b) ලුණු ලේවායක් තැනීමේ දී සැලකිය යුතු කරුණු දෙකක් ලියන්න.

(c) නොගැඹුරු තටාකයේ තැන්පත්වන රසායනික සංයෝගයේ නම ලියන්න.

(d) මධ්‍යස්ත තටාකයේ අවක්ෂේපණය වන ලවණය නම් කරන්න.

ii) ලුණු තිත්ත රසයක් ඇති කරවන සංයෝගය නම් කරන්න.

(B) විද්‍යාගාරයේ දී ඔක්සිජන් වායු ස්වල්පයක් ලබා ගැනීමට සැලසුම් කල ආකාරය දැක්වේ.



i) ඉහත ඇටවුමේ A,B,C නම් කරන්න.

ii) රත් කිරීමට යොදාගත් D දියරය නම් කරන්න.

iii) D දියරය මගින් O_2 ලබා ගැනීම සඳහා තුලිත රසායනික සමීකරණය ලියන්න.

iv) දාහකය සඳහා යොදාගත් L.P වායුවේ අඩංගු හයිඩ්‍රොකාබන වර්ගය නම් කරන්න.

v) සරලම හයිඩ්‍රොකාබනය CH_4 වේ. එහි පූර්ණ දහනය සඳහා තුලිත සමීකරණයක් ලියා දක්වන්න.

(C) පරිණාමකයකට සම්බන්ධ කල ඉලෙක්ට්‍රොනික උපාංගයක් රූපයෙන් දැක්වේ.



I. (a) D උපාංගය නම් කරන්න

(b) D තැනීමට යොදා ගන්නා මූලද්‍රව්‍ය නම් කරන්න

II. පරිණාමකය ක්‍රියාත්මකවන විට භාරය හරහා ගලන ධාරාවේ ස්වභාවය ප්‍රස්තාර සටහනකින් ඇඳ දක්වන්න.

III. පරිණාමකයේ ද්විතීයික පොට ගණන 500 ක් නම් ප්‍රාථමික දඟරයේ පොට ගණන කොපමණදයි සොයන්න

IV. ප්‍රාථමික දඟරයෙන් ගලන ධාරාව 1A නම් ද්විතීයික දඟරයේ හටගන්නා ධාරාව කොපමණ ද?

(D) රූපය උපයෝගී කරගනිමින් පිළිතුරු සපයන්න.



a) රූපයේ දැක්වෙන උපාංගය නම් කරන්න

b) උපාංග සංධි වර්ගය නම් කරන්න

c) x, y, z අග්‍ර නම් කරන්න.